කන්තලේ ප්‍රාදේශීය සභාව
----------------------------
ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය
---------------------------

1 මූල්‍ය ප්‍රකාශන
----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
-----------------------------------

2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2016 ජූනි 30 ද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2015 සැප්තැම්බර් 21 දින ද විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබූ අතර, 2015 වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2016 සැප්තැම්බර් 30 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර මූල්‍ය ප්‍රකාශන වලින් 2015 දෙසැම්බර් 31 දිනට කන්තලේ ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව සත්‍ය සහ සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
----------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

පහත සදහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2015 දෙසැම්බර් 31 දිනට කොන්ත්‍රාත්කරුවන්ට ගෙවිය යුතු රැඳවුම් මුදල රු. 3,176,858 ක් ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) නාගරික සංවර්ධන අධිකාරිය විසින් 2013 වර්ෂයේ සභාවට භාරදුන් කඩකාමර 66 කින් යුත් පොදු වෙළඳපලේ ගොඩනැගිල්ලෙහි සහ කඩකාමර 24 කින් යුත් බස් නැවතුම්පලේ ගොඩනැගිල්ලෙහි වටිනාකම තක්සේරු කර ගිණුමගත කර නොතිබුණි.

(ඇ) වර්ෂය තුල ගෙවන ලද ණය වාරික මුදල වන රු. 811,267 ක් දේශීය ණය හා සංවර්ධන අරමුදල් ගිණුමට හර කර එම ගිණුමේ වෙනස සමුච්චිත අරමුදලට ගැළපීම් කිරීම නිසා සමුච්චිත අරමුදල් ගිණුමේ ශේෂය රු.101,385 ක් අඩුවෙනුත් , දේශීය ණය සංවර්ධන අරමුදල් ගිණුමේ ශේෂය රු.101,385 ක් වැඩියෙනුත් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි.

(ඈ) වර්ෂයට අදාල ණය පොලිය වූ රු. 284,182 ක් සමුච්චිත අරමුදලට ගැළපීම් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා ඇත.

(ඉ) පළාත් පාලන විශ්‍රාම වැටුප් දායක අරමුදලට 2015 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු මුදල රු. 236,989 ක් වුවද, එය මූල්‍ය ප්‍රකාශනවල රු.204,960 ක් ලෙස දක්වා තිබුණි.

1.3.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම්.

විගණනයේදී නිරීක්ෂණය වූ නීති,රීති,රෙගුලාසි සහ විධිවිධානවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| | නීති,රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | පළාත් පාලන කොමසාරිස්ගේ අංක 1980/22 දරන චක්‍රලේඛයේ 3 ඡේදය | හිඟ ආදායම් පිළිබඳ කාල විශ්ලේෂණයක් පිළියෙල කර නොතිබුණි. |
| (ආ) | පළාත් මුල්‍ය රීති රීති 267(5) | ස්ථාවර වත්කම් ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඇ) | ශ්‍රී ලංකා ජනරජයේ මුදල් රෙගුලාසි (මු.රෙ.) 751 | 2015 වර්ෂය තුල මිලදී ගත් රු.130,715 ක් වූ ගෑස් සිලින්ඩර් හා ලී බඩු උපකරණ බඩු ලේඛන පොතෙහි ඇතුළත් කර නොතිබුණි |

2. මුල්‍ය සමාලෝචනය

2.1 මුල්‍ය ප්‍රතිඵලය

2015 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 90,206 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු. 4,405,689 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යය සාධනය

සමාලෝචිත වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂය | ඇස්තමේන්තුගත ආදායම | තථ්‍ය ආදායම | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
|---|---|---|---|
| | රු..000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 1,700 | 2,664 | 9,850 |
| බදු කුලී | 6,710 | 3,028 | 1,824 |
| බලපත්‍ර ගාස්තු | 2,043 | 1,265 | 82 |
| වෙනත් ආදායම් | 36,416 | 35,227 | 3,488 |

2.2.2 මුද්දර ගාස්තු
---------------

නැගෙනහිර පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් 2015 දෙසැම්බර් 31 දිනට මුද්දර ගාස්තු වශයෙන් ලැබිය යුතු මුදල් හදුනා ගැනීමට සහ ලබා ගැනීමට විගණිත දිනය වූ 2016 අගෝස්තු 02 දින වන විටද කටයුතු කර නොතිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය
---------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා
-----------------------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2011 වර්ෂයේ දී පැරණි කඩ කාමර 32 ක් කඩා ඉවත් කර නව පොදු වෙළඳපොලේ කඩ කාමර 66 ක් සහ බස්නැවතුම්පලේ කඩ කාමර 24 ක් නාගරික සංවර්ධන අධිකාරිය විසින් ඉදිකිරීම් සම්පූර්ණ කර 2013 මාර්තු 27 දින ප්‍රාදේශය සභාවට භාර දී තිබුණත් මෙම කඩ කාමර 90 සභාවට පවරාගත් දින සිට නිෂ්කාර්යව පැවතුණි.

(ආ) සභාවේ සේවයේ නියුතුව සිට සේවය හැරගිය හා සේවයෙන් ඉවත්කල සේවකයන් තිදෙනෙකුගෙන් අයවිය යුතු සේවක ණය රු. 1,253,400 ක් ආයතන සංග්‍රහයේ XXIV වන පරිච්ජේදයේ 4 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1993 නොවැම්බර් 18 දින නාගරික සංවර්ධන අධිකාරිය විසින් නිකුත් කර ඇති සැලසුම් චක්‍රලේඛ අංක 15 අනුව අනවසර ඉදිකිරීම් සඳහා වූ සේවා ගාස්තු අය කිරීම් ලංකා බැංකුවේ හෝ මහජන බැංකුවේ ගිණුමක් විවෘත කර එයට බැර කළ යුතු වුවත්, සභාව විසින් එම මුදල් පොදු ගිණුමේ තැන්පත් කර තිබුණි.

(ඇ) 1988 අංක 56 සහ 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරසරික පනතේ 23 "අ" වගන්තියේ විධිවිධාන ප්‍රකාරව පරිසර බලපත්‍ර ලබාගත යුතු සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක වන වඩු කර්මාන්ත,වී ඇඹරුම් හල්, සිමෙන්ති භාණ්ඩ නිෂ්පාදන යන ව්‍යාපාර පිළිබඳ විධිමත් සමීක්ෂණයක් මගින් හදුනා ගැනීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම සභාව විසින් පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගත යුතු එම ව්‍යාපාර වලට පරිසර බලපත්‍ර නිකුත් නොකර වෙළඳ බලපත්‍ර නිකුත් කර තිබුණි.

3.2 අවිධිමත් ගණුදෙණු
----------------------

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ 132(ඒ) සහ (ඔ) වගන්ති ප්‍රකාරව මහජන විනෝද කටයුතු හෝ විනෝදාංශ වෙනුවෙන් සිදුකරනු ලබන මූල්‍ය හෝ ද්‍රව්‍යමය ආධාරවල වටිනාකම එක් වර්ෂයකට මුළු එකතුව රුපියල් දහසක් ඉක්මවන විට දී විෂය භාර අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබාගත යුතු වුවද, එවැනි අනුමැතියකින් තොරව අවස්ථා 05 ක දී රු. 134,664 ක ආධාර ලබා දී තිබුණි.

3.3 වාහන උපයෝජනය
----------------------

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) රථවාහන 08 ක් සඳහා සභාව විසින් ප්‍රවර්තන වර්ෂය සඳහා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

(ආ) සභා වාහනවලට අදාල ලොග් සටහන් පොත්වල වාහනය පිළිබඳ විස්තරය, දැවෙන ඉන්ධන ප්‍රමාණය, වාර්ෂික බලපත්‍ර , ආයුධ සහ අමතර උපකරණ සහ ගමන් පිළිබඳ මාසික සාරාංශ යන විස්තර ඇතුළත් කර නොතිබුණි.

(ඇ) 2015 ජූලි 14 දිනැති රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 04/2015 අනුව මෝටර් රථ සඳහා රක්ෂණාවරණ ලබා ගැනීමේ දී රජය සතු ආයතන වෙතින් ඍජුවම ලබා ගත යුතු වුවත්, සභාව විසින් රක්ෂණ නියෝජිතයකු මාර්ගයෙන් වාහන 06 ක් සඳහා රක්ෂණාවරණ ලබා ගෙන තිබුණි.

3.4. වත්කම් කළමනාකරණය
---------------------------

3.4.1 ඌණ උපයෝජිත වත්කම්
------------------------------

පහත සඳහන් කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 1997 වර්ෂයේ දී මිලදී ගත් වෑන් රථය 2013 නොවැම්බර් මාසයේ සිටද, 1987 වර්ෂයේ දී මිලදී ගත් ට්‍රැක්ටරයක් **2012** අප්‍රේල් සිට ද, 2008 වර්ෂයේ දී මිලදී ගත් කැබ් රථය 2015 ජුනි මස සිටද ක්‍රියාවිරහිතව වාහන අංගනයේ ගාල්කර තිබුණත් ඒ සම්බන්ධයෙන් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ආ) සභාව නමින් ලංකා බැංකුවේ පවත්වා ගෙන යන ජංගම ගිණුම් දෙක රු. 362,360 ක මුදලක් කිසිදු ගණුදෙනුවකින් තොරව 2013 වර්ෂයේ සිට 2016 අප්‍රේල් 29 දින වන තෙක් නිෂ්කාර්යව පැවති අතර, මෙම මුදල් ආයෝජනය කර ආදායම් උපයා ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමු වී නොතිබුණි.

(ඇ) සභාව විසින් ශ්‍රී ලංකා තොරතුරු සන්නිවේදන තාක්ෂණ නියෝජිතායතනයේ අනුග්‍රහයෙන් 2014 වර්ෂයේ සිට පවත්වා ගෙන යනු ලැබූ නැණසල පරිගණක මධ්‍යස්ථානය නිලධාරිනියගේ නොපැමිණීම මත 2015 වර්ෂයේ සිට වසා දමා තිබුණි. මේ හේතුවෙන් ඒ සඳහා ලැබී තිබුණු පරිගණක, ගෘහභාණ්ඩ සහ අනෙකුත් උපකරණ නිශ්කාර්යව පැවත අතර, ග්‍රාමීය ප්‍රදේශයන්හි දරුදැරියන්ට සන්නිවේදන තාක්ෂණ දැනුම ලබා ගැනීමට නොහැකි වී තිබුණි.

3.4.2 භාණ්ඩ සමීක්ෂණය
----------------------

මේ සම්බන්ධයෙන් පහත කරුණු නිරික්ෂණය කරනු ලැබේ.

(අ) 2015 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව පුස්තකාල 05 කට අදාල අස්ථානගත වී තිබූ බවට හඳුනාගත් පොත් 3721 ක් සම්බන්ධයෙන් අවශ්‍යය ක්‍රියාමාර්ග 2016 අගෝස්තු 02 දින වන විටද ගෙන නොතිබුණි.

(ආ) 2014 වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ වාර්තාව අනුව ප්‍රාදේශිය සභාවට අයත් ස්ථාන 11 කට අදාලව පවතින සියළුම භාණ්ඩ අයිතම නව පරිගණක ලේඛනයට අනුව අකාරාදි පිළිවෙලට අංක කර ඒ අනුව බඩු වට්ටෝරු පොත් නැවත සකස් කිරීමට 2016 අගෝස්තු 02 දින වන විටද කටයුතු කර නොතිබුණි.

**3.5** කොන්ත්‍රාත් පරිපාලනය

-----------------------------

3.5.1 බහුකාර්යය ගොඩනැගිල්ල ඉදිකිරීම

---------------------------------------

සභාව 2014 මාර්තු 18 දින රු. 51,093,960 ක කොන්ත්‍රාත් වටිනාකමකට බහුකාර්ය ගොඩනැගිල්ලේ ඉදිකිරීම සඳහා කොන්ත්‍රාත්කරු සමග ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) ගොඩනැගිල්ල ඉදි කිරිමේ දී වැඩබිම තුල කාර්යාලයක් පවත්වා ගැනීම සඳහා සභාව විසින් රු. 469,750 ක මුදලක් ගෙවා තිබුණද, එවැනි කාර්යාලයක් හෝ උපකරණ 2016 අගෝස්තු 02 දින වන විටද දක්නට නොතිබුණි.

(ආ) කොන්ත්‍රාත් ගිවිසුමට අනුව ගිවිසුම්ගත දින සිට මාස 06 ක් ඇතුලත ඉදිකරීම් අවසන් කලයුතු වුවද, කොන්ත්‍රාත්කරුගේ කාර්යය සාධනය අවම මට්ටමක පැවතීම නිසා මෙම ඉදි කිරීම 2016 මැයි 30 දින දක්වා අවස්ථා 05 ක දී දින දීර්ඝ කර තිබුණි. එමෙන්ම, රු. 2,554,698 ක කාර්යසාධන බැදුම්කරයේ වලංගු කාල සීමාව අවසන් වී තිබුණද, එය දීර්ඝ කර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඇ) 2005 අංක 03 දරන මුදල් පනතේ III කොටසේ ප්‍රකාර (2007 අංක 13 හා 2009 අංක 18 දරන මුදල් සංශෝධන පනත්වලින් කරනු ලබන සංශෝධනවලට යටත්ව) කොන්ත්‍රාත්කරුට ගෙවා තිබූ රු. 20,646,905 ට අදාල කර්මාන්ත සහතික අරමුදල් බද්ධ (CIGFL) වන රු. 51,617ක් රඳවා ගෙන දේශීය ආදායම් කොමසාරිස් ජනරාල්ට යැවීමට කටයුතු කර නොතිබුණි.

**3.5.2** ඝන අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථාන ගොඩනැගිල්ල ඉදි කිරිම

---------------------------------------------------------------------

ප්‍රාදේශිය සභාව ඝණ අපද්‍රව්‍ය කළමනාකරණ මධ්‍යස්ථානයේ ගොඩනැගිල්ලක් ඉදිකිරීම වෙනුවෙන් 2011 ජූලි 25 දින ප්‍රජා මණ්ඩල සමිතියක් සමග රු. 324,530 ක කොන්ත්‍රාත් වටිනාකමට ගිවිසුම් අත්සන් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.9.1 වගන්තියට අනුව පවරන ලද වැඩ උප කොන්ත්‍රාත් නොදිය යුතු වුවද, උප කොන්ත්‍රාත්කරුට ගෙවීම් ප්‍රමාද වීම සම්බන්ධයෙන් ඔහු විසින් ප්‍රාදේශිය සභාව වෙත ඉදිරිපත් කරන ලද ලිපි අනුව මෙම ඉදිකිරීම් සමිතිය විසින් උප කොන්ත්‍රාත්කරුවකු වෙත පවරා තිබූ බව තහවුරු විය.

(ආ) ප්‍රමාණ පත්‍රයට අනුව මෙම ගොඩනැගිල්ලේ කොන්ක්‍රීට් කණු 06 ක් තනා බිමට කොන්ක්‍රීට් අතුරා යකඩ (Angle Iron) බට වලින් වහලය තනා ඉදිකර තිබූ අතර එහි වහලය සෙවිලි කර නොතිබූ බැවින් වහලයේ යකඩ බට මළකෑමට ලක් වී තිබුණු බව 2016 අගෝස්තු මස 02 දින කරන ලද භෞතික පරික්ෂාවේදී අනාවරණය විය.

**3.6** මානව සම්පත් කළමනාකරණය

අනුමත හා තථ්‍ය සේවක සංඛ්‍යාව

සභාවේ අනුමත සේවක සංඛ්‍යාවට වඩා වැඩිපුර සේවකයින් බඳවා ගෙන තිබුණි. ඒ පිළිබඳ තොරතුරු පහත වේ.

| තනතුරෙහි ස්වභාවය | අනුමත ප්‍රමාණය | තථ්‍ය ප්‍රමාණය | වැඩිපුර ප්‍රමාණය |
|---|---|---|---|
| රියදුරු | 06 | 08 | 02 |
| කාර්යාල කාර්ය සහායක | 03 | 04 | 01 |
| මුරකරු | 03 | 06 | 03 |
| සෞඛ්‍ය කම්කරු | 12 | 13 | 01 |
| පුස්තකාල සේවා සහායක | 02 | 03 | 01 |
| | **26** | **34** | **08** |

**4.** පද්ධති හා පාලන

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි සභාවේ විශේෂ අවධානය යොමු කරනු ලැබේ.

| | පද්ධතිය | අවධානය යොමු කල යුතු ක්ෂේත්‍රය |
|---|---|---|
| (අ) | ගිණුම්කරණය | **(i)** ගිණුම් තැබීම<br>**(ii)** උපයෝගී ලෙජර් පවත්වා ගෙන යාම |
| (ආ) | ආදායම් පරිපාලනය | හිඟ ආදායම් අයකර ගැනීම |
| (ඇ) | ස්ථාවර වත්කම් පාලනය | **(i)** වත්කම් ලේඛනයක් පවත්වාගෙන යාම<br>**(ii)** නිෂ්කාර්ය වත්කම් ඵලදායී කාර්යන්වල යෙදවීමට කටයුතු කිරීම. |
| (ඈ) | කොන්ත්‍රාත් පරිපාලනය | **(i)** කොන්ත්‍රාත් බදු මුදල් ගෙවීම<br>**(ii)** ගිවිසුමට අනුකූලව කාර්යය ඉටු කිරිම |
| (ඉ) | මානව සම්පත් කළමනාකරණය | අතිරික්ත සේවකයන් බඳවා ගෙන තිබීම |